**ශ්‍රී ලංකා කපු සංස්ථාවේ ගනුදෙනු වාර්තාව - 2019**

---

**ශ්‍රී ලංකා කපු සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.**

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු 2019 වර්ෂයේ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින දක්වාම විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.**

**2. විගණන නිරීක්ෂණ**

---

**2.1 ලිඛිත නීතිරීති හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවීම.**

---

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දක්වා ඇත.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කලමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 25 දරන (සංශෝධිත) එකතු කළ අගය මත බදු පනත සහ 2018 අංක 20 දරන ජාතික ගොඩනැගීමේ පනත | බදුවන භාණ්ඩ, සේවා හෝ සැපයුම් කාර්තුවකට රු.3,000,000 ක් හෝ වාර්ෂිකව රු.12,000,000 හෝ ඉක්මවන්නේ නම් VAT සහ NBT සඳහා ලියාපදිංචි වී ගෙවීම සිදු කළ යුතු | මෙහි සඳහන් බදු කපුවල විකුණුම් මිලට එකතු කිරීම හරහා ඉහළ යන මිල මත සංස්ථාවේ කපු සඳහා පවතින වෙළෙඳපොළ ඉල්ලුම සම්බන්ධයෙන් නිර්මාණය විය හැකි | පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වුවත්, සංස්ථාව විසින් 2019 වර්ෂය සඳහා රු. 106,475,947 ක පිරිවැටුමක් උපයාගෙන තිබුණද, VAT සහ NBT සඳහා ලියාපදිංචි වීමක් හෝ බදු ගෙවීමක් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | අහිතකර බලපෑම් හා කජු නිෂ්පාදන කෘෂිකාර්මික නිෂ්පාදන යටතට ගැනෙන බැවින්ද විශේෂ අවධානය යොමු කරමින් විශේෂ බදු සහනයක් ලබා ගැනීම පිණිස රේඛීය අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. මේ සඳහා ලැබෙන ප්‍රතිචාර මත ඉදිරි කටයුතු සිදුකිරීමට තීරණය කර ඇත. | |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10 (2) වගන්තිය | සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීමේදී අදාළ මාසයේ දායක මුදල ඊළඟ මාසයේ අවසන් දිනට පෙර ගෙවිය යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දිනට මෙම වර්ෂයේ අප්‍රේල්, මැයි, ජූනි, ජූලි මාස වලට අදාළව 6,612,177 ක සේවක අර්ථ සාධක අරමුදල් නොගෙවා පැවතුණි. 2020 ජූනි 30 දින වන විටත් 2019 වර්ෂයේ මැයි, ජූනි, ජූලි මාස වලට අදාළ දායක මුදල් ගෙවා නොතිබුණි. | සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුකොට ගෙන මෙම විගණන ඡේදයන්හි සඳහන් ගෙවීම් ප්‍රමාද වී ඇති අතර, මුදල් ලද වහාම අදාළ ගෙවීම් සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. | අර්ථ සාධක අරමුදල් පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1983 අංක 12 දරන සේවක පාරිතෝෂිත පනත | සේවකයා සේවයෙන් විශ්‍රාම ගොස් මසක් ඇතුළත පාරිතෝෂිත ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම ගන්නා ලද නිලධාරීන් 8 දෙනෙකුගේ පාරිතෝෂිත 2020 ඔක්තෝබර් මස දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි. | සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුකොට ගෙන මෙම විගණන ඡේදයන්හි සඳහන් ගෙවීම් ප්‍රමාද වී ඇති අතර, මුදල් ලද වහාම අදාළ ගෙවීම් සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **18** වගන්තිය | සංස්ථාව විසින් ඉන්වොයිස් පත්‍රයේ සඳහන් දිනයේ සිට දින තිහක් ඇතුළත විගණන ගාස්තු නිරවුල් කළයුතු වුවත් **2005** වර්ෂයේ සිට **2018** වර්ෂය දක්වා ගෙවියයුතු විගණන ගාස්තුව රු.**2,552,208** ක් සමාලෝචිත වර්ෂය දක්වා නිරවුල් කර නොතිබුණි. | සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුකොට ගෙන මෙම විගණන ඡේදයන්හි සඳහන් ගෙවීම් ප්‍රමාද වී ඇති අතර, මුදල් ලද වහාම අදාළ ගෙවීම් සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. | පනතේ විධිවිධාන අනුව විගණන ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | **2012** ජුලි **24** දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ | පොදු ව්‍යාපාර කාරක සභාව විසින් සංස්ථාවට නීත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දී තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ලබා දී ඇති කජු වගා කරන ඉඩම් අක්කර **15,329** ක නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට පවරා ගැනීමට අදාළ කටයුතු **2020** මැයි **31** දින දක්වාම නිම කර නොතිබුණි. | දැනට ශ්‍රී ලංකා කජු සංස්ථාව මඟින් පරිහරණය කරනු ලබන ඉඩම්වල මුළු අක්කර ප්‍රමාණය **15,329** ක් ලෙස සඳහන් වුවද එය අක්කර **12,044** ක් ලෙස නිවැරදි විය යුතුය. ඉන් අක්කර **9,674** ක් වන වතු යායන් හා බීජ උද්‍යානය වල අයිතිය දීර්ඝ කාලීන බදු පදනම යටතේ ශ්‍රී ලංකා කජු සංස්ථාවට පවරාදීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව එම ඉඩම් පිහිටි ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ එක්ව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරගෙන යනු ලැබේ. තවද අක්කර **1,874** ක ඉඩම් කොටස් දැනටමත් දීර්ඝ කාලීන බදු පදනම යටතේ මෙම සංස්ථාව වෙත පවරා ඇති අතර, ඒවායේ බදු ගෙවීමට පවතී. අනෙක් ඉඩම්වල අයිතිය මෙම සංස්ථාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම්වල නීත්‍යායුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුත්තලම හා කමන්දළුව පර්යේෂණ මධ්‍යස්ථාන සඳහා පුනරාවර්තන ප්‍රදාන යටතේ රු.3,412,063 ක් හා ප්‍රාග්ධන ප්‍රදාන යටතේ රු.3,927,223 ක් ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ නව පර්යේෂණ කිසිවක් ආරම්භකර නොතිබූ අතර මධ්‍යස්ථාන දෙකෙහිම පෙර වර්ෂවල සිට ඉදිරියට එමින් පැවති පර්යේෂණ 08 ක් පමණක් සිදුවෙමින් පැවතුණි. තවද පර්යේෂණවල ප්‍රගතිය ඇගයීම් කළහැකි පරිදි අඛණ්ඩ හා විධිමත් ප්‍රගති වාර්තා නඩත්තු කිරීමක්ද කර නොතිබුණි. | කජු ආශ්‍රිතව සිදුකරනු ලබන සියළු පර්යේෂණ අඛණ්ඩව වර්ෂ කිහිපයක් පුරා සිදුකරනු ලබන අතර මෙහි සඳහන් පර්යේෂණ එවැනි ඒවා වේ. මෙම පර්යේෂණ වල ප්‍රතිඵලය ලෙස මෙම වර්ෂයේදී නව වැඩි දියුණු කළ කජු ප්‍රභේද 03 ක් නිකුත් කර ඊළඟ වර්ෂයේදී තවත් වැඩි දියුණු කළ නව කජු ප්‍රභේද 02 ක් ක්ෂේත්‍රයට හඳුන්වාදීමට නියමිතව පවතී. නව පර්යේෂණ වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කර ඇත. පර්යේෂණ අංශය මඟින් සිදුකරනු ලබන පර්යේෂණ වැඩසටහන් වල ප්‍රගතිය සම්බන්ධයෙන් මාසික ප්‍රගති වාර්තාවක් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. | පර්යේෂණවල ප්‍රගතිය ඇගයීම් කළ හැකි පරිදි අඛණ්ඩ හා විධිමත් ප්‍රගති වාර්තා නඩත්තු කිරීමක් කළ යුතුය. |
| (ආ) | 2019 ජූලි 02 දින පැවති 524 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අලෙවි කටයුතු ප්‍රවර්ධනය සඳහා විධිමත් පරිදි අලෙවි සැලැස්මක් සකස්කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පසුගිය කාලසීමාවේ Covid- 19 වසංගත තත්ත්වය හේතු කොටගෙන අලෙවි ක්‍රියාකාරකම් වල සිදුවූ වෙනස්කම් සැලකිල්ලට ගෙන එම සැලැස්ම සංශෝධනය කර ඇති අතර සංශෝධන අලෙවි සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 අගෝස්තු 30 දින පැවති 526 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අලෙවි අංශයට අදාළව ඉදිරි කාලය සඳහා නිෂ්පාදන සැලැස්මක් සහ ඊට අනුරූපව අලෙවි සැලැස්මක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස හා රජයේ ආයතන වලට සහන මිලට කජු ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කර සංස්ථා කජු | රජයේ ආයතනවලට සහන මිලට කජු ලබාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම දැනට සිදුවන අතර, එහි ආරම්භක පියවර ලෙස මුදල් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට 10% කට ආසන්න වෙළෙඳ වට්ටම් ප්‍රතිශතයක් ලබාදෙමින් කජු අලෙවි කිරීමේ කටයුතු ප්‍රවර්තන වර්ෂය තුළදී සිදුකර ඇත. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රචලිත කිරීමේ වැඩපිළිවෙලක් සකස් කරන ලෙසද අධ්‍යක්ෂ මණ්ඩලය දන්වා තිබුණත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඈ) | වයින් ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබූ රු.246,127 ක තොගය හා රු.5,550 ක බෝතල්ද වර්ෂයේ අලාභ ලෙස කපා හැර තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය සඳහා පසුගිය වර්ෂයේදී රු.66,700 ක උපදේශන ගාස්තුවක් බාහිර පුද්ගලයෙකුට ගෙවා තිබුණද කිසිදු ආදායමක් සංස්ථාව විසින් උපයා නොතිබුණි. | මෙහි සඳහන් 2018 වර්ෂයේ වයින් නිෂ්පාදනයේ නියැදි රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යැවූ පසු එහි Acid ප්‍රමාණය සාපේක්ෂව ඉහළ යැයි වාර්තා වූ බැවින් එම වයින් තොගය ප්‍රතික්ෂේප විය. ඒ අනුව අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට උත්සාහ දැරුවද ඒවා සියල්ල ව්‍යර්ථ විය. ඒ අනුව පාලනාධිකාරියේ අනුමැතිය මත අදාළ අපහරණ කටයුතු සිදු කරන ලදි. | නිවැරදි උපදේශනයක් යටතේ නියැදියක් නිෂ්පාදනය කර රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ පාරිතෝෂිත අරමුදල් නිසි දිනට නොගෙවීම මත අධිභාර ලෙස රු. 96,607 ක මුදලක් ගෙවා තිබුණි. | සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුකොට ගෙන පාරිතෝෂික ගෙවීම් ප්‍රමාද වීම හේතුකොට ගෙන මෙම අධිභාරයන් ගෙවීමට සිදු වී ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ජංගම වත්කම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 1.5 ක් සහ 0.64 ක අගයක පවතින අතර වර්ෂය අවසානයේ එකතුව රු.14,608,861 ක ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවක වැටුපෙන් කර ඇති අඩුකිරීම් නොගෙවීම මත සංස්ථාව කාරක ප්‍රාග්ධන අර්බුදයක පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතා පවතින නමුත් දෛනික මෙහෙයුම් ක්‍රියාකාරකම් හැකි උපරිම පවත්වාගෙන යනු ලැබේ. ඉහත සඳහන් මූල්‍ය දුෂ්කරතා හේතුකොට ගෙන වෛද්‍යාධාර ගෙවීම් වලද ප්‍රමාදයක් සිදු වූ අතර, කෙසේ නමුත් ප්‍රවර්තන වර්ෂය තුළදී 2018 වර්ෂයේ සියලු වෛද්‍යාධාර ගෙවීම් වලින් 1/3 ක්ද සම්පූර්ණ කර ඇත. පවතින මූල්‍ය දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඉතිරි වෛද්‍යාධාර මුදල්ද කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත ගෙවීමට කටයුතු කරනු ලැබේ. | ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවක වැටුපෙන් ඇති අඩු කිරීම් නියමිත පරිදි ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (උ) | භාණ්ඩාගර අනුමැතියෙන් තොරව කප්‍රු සංස්ථාව 2013 ජූනි 04 දින සිට ක්‍රියාත්මක කර තිබූ වෛද්‍යාධාර | සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතා පවතින නමුත් දෛනික මෙහෙයුම් ක්‍රියාකාරකම් හැකි උපරිම පවත්වාගෙන යනු ලැබේ. ඉහත | භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු අතර ගෙවීම් නිසි පරිදි සිදු |

| | | | |
|---|---|---|---|
| | යෝජනා ක්‍රමය යටතේ සේවකයා සහ පවුලේ සාමාජිකයින් සඳහා බාහිර ප්‍රතිකාර සඳහා වාර්ෂිකව රු.15,000 ක වියදම් ප්‍රතිපූර්ණය කරන අතර ඒ සඳහා මාසිකව සේවකයින්ගේ වැටුපෙන් සාමාජික ගාස්තු ලෙස රු.300 ක් අයකර තිබුණි. එහෙත් මෙම යෝජනා ක්‍රමය යටතේ සේවකයින් බාහිර ප්‍රතිකාර සඳහා බිල්පත් ඉදිරිපත් කර තිබුණද එකී වියදම ප්‍රතිපූර්ණය කිරීම වර්ෂ 3 ක කාලයක සිට සිදුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගෙවිය යුතු වෛද්‍යාධාර රු.3,470,925 ක් වී තිබුණි. | සඳහන් මූල්‍ය දුෂ්කරතා හේතුකොට ගෙන වෛද්‍යාධාර ගෙවීම් වලද ප්‍රමාදයක් සිදු වූ අතර, කෙසේ නමුත් ප්‍රවර්තන වර්ෂය තුළදී 2018 වර්ෂයේ සියලු වෛද්‍යාධාර ගෙවීම් වලින් 1/3 ක්ද සම්පූර්ණ කර ඇත. පවතින මූල්‍ය දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඉතිරි වෛද්‍යාධාර මුදල්ද කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත ගෙවීමට කටයුතු කරනු ලැබේ. | කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඍ) | වාණිජ පැළතවාන් යටත් ණයගැතියෝ ලෙස රු.10,426,696 ක මුදලක් පවතින අතර ඉන් රු.9,466,200 ක් වසර 07කට වඩා පැරණි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු වටිනාකමක් වේ. මෙම මුදල් අයකර ගැනීමට නොහැකි තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය. | මෙහි සඳහන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ණය වටිනාකම අයකරවා ගැනීම සඳහා දැඩි උත්සාහයක් ගනු ලැබූ නමුත් එය අසාර්ථක වී ඇත. කෙසේ නමුත් එම ණය අයකරවා ගැනීම සඳහා අඛණ්ඩව කටයුතු සිදුකරනු ලැබේ. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | වර්ෂ 06 ක් ඉක්ම වූ වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු රු.3,500,000 ණය මුදල සහ ඊට අදාළ රු.927,500 ක පොලිය ගෙවීමට කටයුතු කර නොතිබුණි. | සංස්ථාවේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුකොට ගෙන මෙම ණය ගෙවීම් ප්‍රමාද වී ඇත. මූල්‍ය තත්වය යහපත් වූ පසු කොටස් වශයෙන් හෝ මෙම ණය ගෙවීමට කටයුතු කරනු ලැබේ. | ණය මුදල් සහ පොලිය නියමිත ලෙස ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් යතුරු පැදි 19 ක් අලෙවි කර තිබූ අතර ඉන් රු.175,000 ක ආදායමක් උපයා තිබුණි. 2019 මැයි මස 28 දින පැවති | මෙහි සඳහන් ඉතා අබලන් ධාවන තත්ත්වයෙන් නොමැති එමෙන්ම අලුත්වැඩියා කර භාවිතයට ගැනීම සංස්ථාව ආර්ථික වශයෙන් වාසිදායක නොවන යතුරු පැදි 19 ක ප්‍රමාණය සංස්ථාවේ නැඳගමුව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **523** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී යතුරු පැදි **19** ක ප්‍රමාණයම එක් පුද්ගලයෙකු මිලදී ගන්නේ නම් එය තක්සේරු වටිනාකමට වඩා වැඩි අගයකට විකිණිය යුතු බව දක්වා තිබූ නමුත් සංස්ථාව විසින් රු.**343,500** ක තක්සේරු වටිනාකමක් සහිත යතුරු පැදි **19** ක ප්‍රමාණය රු.**175,000** ක මුදලකට පෞද්ගලික ගැණුම්කරුවකුට විකුණා තිබුණි. | පිරිසැකසුම් මධ්‍යස්ථානයයේ ආරක්ෂිතව ගාල් කර තිබූ අතර ඒවා අලෙවි කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කරන ලදි. ඒ අතරතුර එම යතුර පැදි සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු වාර්තාවක්ද ලබා ගන්නා ලදි.<br>පළ කරන ලද පුවත්පත් දැන්වීමට ප්‍රතිචාර නොලැබුනු බැවින් ප්‍රාදේශීය වශයෙන් මිල ගණන් කැඳවීමක් සිදු කළ අතර එහිදී යතුරු පැදි සියල්ලම එකවර මිලදී ගැනීමට ගැණුම්කරුවෙකු ඉදිරිපත් විය.<br><br>තවදුරටත් මෙම අබලන් යතුරු පැදි සංස්ථාව භාරයේ පවත්වාගෙන යැමෙන් ඒවා සුන්බුන් අගයකට හෝ අලෙවි කිරීමට නොහැකි වන බැවින්ද අදාළ යතුරු පැදි වල ප්‍රායෝගික තත්ත්වයට අනුව ලද මිල ගණන සාධාරණ යැයි හැඟී ගිය බැවින්ද සංස්ථාවට අලාභ අවම කර ගැනීමේ අරමුණින් අදාළ යතුරු පැදි එම ගැණුම්කරුවාට අලෙවි කරන ලදි. | |

## 2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **2017** වර්ෂයේදී අම්පාර හාඩි වතුයායේ පිහිටි පුහුණු කිරිමේ මධ්‍යස්ථානය සංචාරක බංගලාවක් බවට පරිවර්තනය කිරීමට සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනිම සඳහා රු.**5,050,354** ක මුදලක් වියදම් කර තිබුණද, මෙම සංචාරක බංගලාව කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂයේ රු.**48,000** ක ආදායමක් පමණක් උපයා තිබුණි. | මෙම සංචාරක බංගලාව බාහිර පාර්ශවයන්ට බදු දීමකින් තොරව සංස්ථාව මඟින්ම සංචාරකයින්ගේ ඇණවුම් ලබාගෙන පවත්වාගෙන යාමට පාලනාධිකාරිය විසින් තීරණය කරන ලදි. ඒ සඳහා අවශ්‍ය ප්‍රචාරණ කටයුතු හා අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් ඉහල අවධානයක් යොමු කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | සංචාරක බංගලාවෙන් වැඩි ආදායමක් උපයා ගත හැකි ක්‍රියාමාර්ග වලට යොමු විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුත්තලම කජු සැකසුම් මධ්‍යස්ථානයේ කජු තැම්බීම සඳහා යොදා ගන්නා ලද වසර **24** කට වඩා පැරණි රු.**526,700** ක් වටිනා බොයිලේරු පද්ධතිය වෙන්දේසි කිරීමට සහ එම මධ්‍යස්ථානයේම පවතින අතින් කජු කපන යන්ත්‍ර **11** ක් භාවිතා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බොයිලේරුව තවදුරටත් භාවිතයට ගත නොහැකි බැවින් අදාළ අපහරණය කටයුතු වෙනුවෙන් එහි තක්සේරු වාර්තාවක් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වෙත ලිපියක් යවා ඇත. අදාළ තක්සේරු වාර්තාව ලද වහාම ඉදිරි අපහරණය කටයුතු නිම කරනු ලැබේ.<br><br>හදිසි විදුලි බිඳවැටීමකදී පිරිසැකසුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා අතින් කජු කැපීමේ යන්ත්‍ර භාවිතයට ගනු ලැබේ. | අපහරණය කටයුතු කඩිනමින් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වයින් ව්‍යාපෘතිය සඳහා මිලදී ගන්නා ලද රු.**142,980** ක ලේබල් එම ව්‍යාපෘතිය අවසාන වීම නිසා නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | වයින් නිෂ්පාදන නැවතත් ආරම්භ කල පසු මෙම සියලු ඇසුරුම් ද්‍රව්‍ය භාවිතයට ගත හැක. | වයින් නිෂ්පාදනය ආරම්භ කර ඇසුරුම් ද්‍රව්‍ය හැකි ඉක්මනින් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.4** කාර්යය මණ්ඩල කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් තනතුරු වල පුරප්පාඩු **02** ක්ද, තෘතියික මට්ටමට අයත් තනතුරු වල පුරප්පාඩු **08** ක්ද, ද්විතියික මට්ටමට අයත් තනතුරු වල පුරප්පාඩු **45** ක්ද, ප්‍රාථමික මට්ටමට අයත් තනතුරුවල පුරප්පාඩු **11** ක් පැවතුණද එම තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | සංස්ථා තනතුරු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

**2.5** තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" හා 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශක හඳුනාගත යුතු වුවද, සංස්ථාව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ළඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළයුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි. | 2021 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |